# විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව

ආයතන චක්‍රලේඛ ලිපි අංක : 17/2014

නො. 20, වෝඩ් පෙදෙස,
කොළඹ 07
2014, දෙසැම්බර් මස 30 වන දින.

උපකුලපතිවරුන්
මණ්ඩපාධිපතිවරුන්
ආයතන අධ්‍යක්ෂවරුන්

**<u>රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/2014 අදාල කර ගැනීම- විශේෂ අත්තිකාරම් ගෙවීම</u>**

2014.12.29 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/2014 දරන “රජයේ නිලධාරින්ට විශේෂ අත්තිකාරම්” මැයෙන් නිකුත් කර ඇති චක්‍රලේඛය කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

2015 වර්ෂය සඳහා රු. 4000/- කට නොවැඩි වන විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීම සඳහා වන ඉහත සඳහන් චක්‍රලේඛයෙහි සඳහන් උපදෙස් අනුගමනය කරන මෙන් කරුණාවෙන් දන්වා සිටිමි. මෙම අත්තිකාරම් ගෙවීම 2015.01.01 දිනෙන් ආරම්භ කර 2015.02.28 දිනෙන් අවසන් කළ යුතු වේ. 2015.02.28 දිනට පසු මෙම ගෙවීම නොකළ යුතුය.

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 29/2014 හි පිටපතක් දැනගැනිම සහ අවශ්‍ය කටයුතු සඳහා මේ සමග අමුණා ඇත.

අ/කළේ: මහාචාර්ය ක්ෂණිකා හිරිඹුරේගම
සභාපතිනිය

පිටපත්:

1. ලේකම්/ උසස් අධ්‍යාපන අමාත්‍යාංශය
2. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සභාපති කාර්යාලය
3. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ උප සභාපති
4. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයින්
5. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ලේකම්
6. පීඨාධිපතිවරුන්
7. විශ්වවිද්‍යාල වල ලේඛකාධිකාරිවරුන්
8. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ගණකාධිකාරී
9. විශ්වවිද්‍යාල වල මුල්‍යාධිකාරීවරුන්
10. උසස් අධ්‍යාපන ආයතන වල පුස්තකාලයාධිපතිවරුන්/ජ්‍යෙෂ්ඨ සහකාර පුස්තකාලයාධිපතිවරුන් / සහකාර පුස්තකාලයාධිපතිවරුන්
11. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය ලේඛකාධිකාරිවරුන්/ජ්‍යො.ස.ලේ /ස.ලේ
12. උසස් අධ්‍යාපන ආයතන /මණ්ඩප වල නියෝජ්‍ය මුල්‍යාධිකාරීවරුන්/ජ්‍යො.ස.මු/ස.මු
13. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක
14. විශ්වවිද්‍යාල වල රජයේ විගණන අධිකාරිවරුන්
15. උසස් අධ්‍යාපන ආයතන වල ජ්‍යෙෂ්ඨ සහකාර අභ්‍යන්තර විගණකවරුන්/ ස.අ.වි
16. වෘත්තීය සමිතිවල ලේකම්වරුන්
17. විගණකාධිපති

ගොනු අංකය: යූ.ජී.සී./එච්.ආර්./6/5/1

රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 29/2014

මගේ අංකය : EST-7/LOANS/04/0207
රාජ්‍ය පරිපාලන සහ
ස්වදේශ කටයුතු අමාත්‍යාංශය
නිදහස් චතුරස්‍රය
කොළඹ 07.

2014.12.29

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්

## රජයේ නිලධාරීන්ට විශේෂ අත්තිකාරම්

2006.11.25 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 20/2006 කෙරෙහි ඔබගේ අවධානය යොමු කරවමි.

02. එකී චක්‍රලේඛයේ 03 ඡේදයේ 2006 වර්ෂය යන්න වෙනුවට 2014 වර්ෂය යන්න ආදේශ කිරීමට සහ 2007 වර්ෂය ලෙස සඳහන්ව ඇති සෑම ස්ථානයකටම 2015 වර්ෂය යන්න ආදේශ කිරීමට යටත්ව එකී චක්‍රලේඛයේ විධිවිධාන ප්‍රකාරව 2015 වර්ෂයට රු. 4000/-කට නොවැඩි වන විශේෂ අත්තිකාරම් මුදලක් ගෙවීමට රජය තීරණය කර ඇත. එසේම එම චක්‍රලේඛයේ 08 ඡේදයේ සඳහන් අයකර ගනු ලබන පොළිය බැර කළ යුතු ආදායම් ගිණුම් සංකේත අංක 20.02.20.02 (පොළිය හා වෙනත්) ද අංක 20.02.20.99 ලෙස සංශෝධනය කෙරේ.

03. මෙම අත්තිකාරම් ගෙවීම 2015.01.01 දිනෙන් ආරම්භ කර 2015.02.28 දිනෙන් අවසන් කළ යුතු වන අතර, 2015.02.28 දිනට පසු මෙම අත්තිකාරම් ගෙවීම නොකළ යුතුය.

04. මෙම චක්‍රලේඛය මහා භාණ්ඩාගාරයේ එකඟතාව ඇතිව නිකුත් කරන ලදී.

පී.බී. අබේකෝන්
ලේකම්
රාජ්‍ය පරිපාලන සහ ස්වදේශ කටයුතු අමාත්‍යාංශය